සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ..................................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

**I කොටස**
- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **තිත් ඉර මත** ලියන්න.

**II කොටස**
- අනුකොටස් **තුනකින්** සමන්විත ය. 'අ' කොටසින් ප්‍රශ්න දෙකක් හා 'ආ' සහ 'ඉ' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

* I කොටසට හා II කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

| පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණයි. | |
|---|---|
| I පත්‍රය සඳහා | |
| කොටස | ලකුණු |
| I | |
| II | |
| එකතුව | |
| 1 වැනි පරීක්ෂක | 2 වැනි පරීක්ෂක |

## I කොටස

● ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් එක් එක් ප්‍රශ්නවලට **වඩාත් නිවැරදි පිළිතුර** තෝරන්න.

1. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර අතර උත්කීරණ ක්‍රමය අනුව සිත්තම් කර ඇති 'ඇතා සහ පැටියා' සිතුවම දක්නට ලැබෙනුයේ,

(1) තන්තිරිමලේ ගුහාවෙහි ය. (2) බටදොඹ ලෙනෙහි ය.
(3) දොරවක ලෙනෙහි ය. (4) බිල්ලෑව ගුහාවෙහි ය.
(5) වෙට්ටම්බුගල ගුහාවෙහි ය. (.........)

2. 'බුදුන් වහන්සේට තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් විසින් විළඳ මී පිඩු පූජා කෙරෙන සිතුවම' දක්නට ඇත්තේ,

(1) දිඹුලාගල මාරාවීදිය ලෙන් තුළ ය. (2) මහියංගනය ස්ථූප චිත්‍ර අතර ය.
(3) පුල්ලිගොඩ ලෙන් චිත්‍ර අතර ය. (4) හිඳගල ලෙන් බිත්තියේ ය.
(5) ගොනාගොල්ල ලෙනෙහි ය. (.........)

3. වර්ෂ 1891 දී ශ්‍රී ලංකාවේ කලා සංගමය ආරම්භ කිරීමේ අරමුණ වූයේ,


(1) අමූර්තවාදී සංකල්ප ප්‍රචලිත කිරීමයි.
(2) සාම්ප්‍රදායික දේශීය චිත්‍ර කලාව ආරක්ෂා කර ගැනීමයි.
(3) වියුක්තරූපී සංරචන විධි හඳුන්වා දීමයි.
(4) ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී චිත්‍ර ක්‍රමය ප්‍රචලිත කිරීමයි.
(5) ඝනිකවාදී ශිල්පක්‍රම හඳුන්වා දීමයි. (.........)

[දෙවැනි පිටුව බලන්න.


4. භාරතයේ 'මෞර්ය' යුගයේ ඉදි වූ නිර්මාණශීලීත්වයෙන් අනූන ස්ථම්භ ශීර්ෂය සේ සැලකෙන්නේ,
   (1) ලෞරියා නන්ද නගර් ය.
   (2) රාම්පූර්වා ය.
   (3) සාරානාත් ය.
   (4) සාංචිය ය.
   (5) වෛශාලි ය. (.........)


5. යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් අතර 'දිගින් අඩි 17 ක් වන ගව රුව' දක්නට ලැබෙන ගුහාව වනුයේ,
   (1) පොන්ඩිගෝම් ය.
   (2) ලැස්කෝ ය.
   (3) ඇල්ටමීරා ය.
   (4) ෂෝවේ ය.
   (5) කෝගුල් ය. (.........)

● ප්‍රශ්න අංක **6** සිට **10** තෙක් අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් ගැලපෙන පිළිතුර** අංක **1** සිට **9** තෙක් අංක කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


1



2


3



4


5


6


7


8


9

6. කඩොල්ගල්ල පරපුරේ සිත්තරුන් විසින් අඳින ලද සිතුවම කුමක් ද?
   (1) **4** (2) **5** (3) **6** (4) **8** (5) **9** (.........)

7. ජාතක කථා තේමා **නොවන** සිතුවම් මොනවා ද?
   (1) **4,5** (2) **5,6** (3) **6,7** (4) **7,8** (5) **7,9** (.........)

8. මැදවල විහාරයෙන් උපුටාගෙන ඇති සිතුවම් මොනවා ද?
   (1) **1,3** (2) **2,3** (3) **3,4** (4) **4,5** (5) **5,6** (.........)

9. මේ අතරින් ලෙන් විහාර ආශ්‍රිත සිතුවම් ලෙස සැලකෙන්නේ මොනවා ද?
   (1) **1,2,5** (2) **2,3,5** (3) **2,5,7** (4) **4,5,7** (5) **5,6,7** (.........)


10. මහනුවර සම්ප්‍රදායේ උඩරට ශෛලීය නිරූපිත සිතුවම් මොනවා ද?
   (1) **1,2,3,7** (2) **2,3,4,7** (3) **3,4,5,6** (4) **4,5,6,9** (5) **5,6,7,8** (.........)

[තුන්වැනි පිටුව බලන්න.

● ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන පිළිතුර** A, B, C, D, E ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.



A



B



C



D



E

11. A අක්ෂරයෙන් දැක්වෙන්නේ,
 (1) වියුක්ත ඝනරූපී හැඩතල යොදාගත් චිත්‍රයකි.
 (2) ඝන මාධ්‍ය භාවිතයෙන් කළ යථාරූපී සිතුවමකි.
 (3) වර්ණ භාවිතයේ දී ශාස්ත්‍රාලයීය ශිල්පක්‍රම උපයෝගී කොට ගත් චිත්‍රයකි.
 (4) වස්තුන්ගේ ප්‍රකෘති ස්වභාවය යථාරූපීව භාවිත කළ අවස්ථාවකි.
 (5) ප්‍රකාශනයේ තීව්‍රතාව උදෙසා විසංගතව වර්ණ භාවිත කිරීමකි. (.........)

12. B අක්ෂරයෙන් දැක්වෙන චිත්‍රය නිර්මාණය කළ නාරායන ස්වාමි,
 (1) කෝවිල් චිත්‍ර සඳහා බටහිර ශිල්පක්‍රම භාවිත කළේය.
 (2) කතාන්දර කීමේ ක්‍රමවේදය අනුව චිත්‍ර නිර්මාණය කළේය.
 (3) ස්වභාවිකත්වය නිරූපණය කිරීමට මුල්තැන දුන්නේය.
 (4) වර්ණවලට වඩා රේඛාවට වැඩි අවධානයක් යොමු කළ කළේය.
 (5) හින්දු සාහිත්‍යයේ එන සිද්ධි තත්ත්වාකාරයෙන් නිරූපණය කළේය. (.........)

13. C අක්ෂරයෙන් දැක්වෙන රිචඩ් ගේබ්‍රියල්ගේ සිතුවම,
 (1) ආගමික කාර්යයක් සඳහා යන කාන්තාවන් පිළිබඳ විග්‍රහයකි.
 (2) රූප හා වර්ණ නිරූපණාත්මකව හා සංකේතාත්මකව භාවිත කිරීමකි.
 (3) තලය පුරා මනා වර්ණ සංගතතාවක් රැකගත් කෘතියකි.
 (4) කාන්තාවන් දෙපිරිසක් අතර පුවතක් නිරූපණය කරන්නකි.
 (5) යථාරූපී ස්වරූපය ශෛලිගතව නිරූපණය කිරීමකි. (.........)


14. D අක්ෂරයෙන් දැක්වෙන ජෙමිනි රෝයිගේ සිතුවම,
 (1) දඩයම් සිද්ධියක් යථාර්ථවාදීව ඉදිරිපත් කිරීමකි.
 (2) ඉන්දීය කලා ලක්ෂණ නිරූපිත කල්පිත ප්‍රකාශනයකි.
 (3) ඉන්දීය ජන කලා ආභාසය අනුව කළ ශෛලීගත සංරචනයකි.
 (4) ශිල්පියා තමාට ආවේනික ශෛලිය අනුව කළ නිර්මාණයකි.
 (5) කල්පිතයක් වියුක්තරූපීව දැක්වීමට දැරූ උත්සාහයකි. (.........)


15. E අක්ෂරයෙන් දැක්වෙන කාන්තා රූපය,
 (1) ශෝකාත්මක බව ප්‍රකාශ කෙරෙන ආලේඛ්‍ය චිත්‍රයකි.
 (2) විමසුම් ස්වභාවය නිරූපිත ස්වභාවිකවාදී රෝම ආලේඛ්‍ය චිත්‍රයකි.
 (3) රෝම ශිල්පියෙකු විසින් කළ ස්ත්‍රීත්වය පිළිබඳ තාත්වික ප්‍රකාශනයකි.
 (4) රෝම ශිල්පියෙකුගේ ආලේඛ්‍ය චිත්‍ර කලාව පිළිබඳ නිදසුනකි.
 (5) රූමත් තරුණ කාන්තාවක් පිළිබඳව කෙරෙන චිත්‍රමය විග්‍රහයකි. (.........)


[හතරවැනි පිටුව බලන්න.

- ප්‍රශ්න අංක **16** සිට **20** තෙක් ප්‍රශ්නවලට **වඩාත් යෝග්‍ය පිළිතුර** පහත සඳහන් **F, G, H, I, J** ලෙස නම් කර ඇති කැටයම් ඡායාරූප ඇසුරෙන් තෝරන්න.


F


G


H


I


J

**16.** **F** අක්ෂරයෙන් දැක්වෙන ඉසුරුමුණි කැටයම,

(1) ඇතුන්ගේ සරල හැඩතල කැටයම් කළ මහගු නිර්මාණයකි.
(2) ජල ක්‍රීඩාවට සැරසෙන ඇතුන් නිරූපණය කිරීමට ගත් උත්සාහයකි.
(3) මහත් ආයාසයකින් යුතුව ඇතුන්ගේ චලන ඉරියව් යථාරූපීව නිරූපණය කිරීමකි.
(4) පිහිටි ගලේ ස්වභාවය උපයෝගී කරගනිමින් ඇතුන්ගේ චලන ඉරියව් නිරූපණය කිරීමකි.
(5) ඇතුන්ගේ නිසල ඉරියව් ස්වභාවික අයුරින් මතුකිරීමට ගත් උත්සාහයකි. (.........)

**17.** **G** අක්ෂරයෙන් දැක්වෙන සඳකඩපහණ,

(1) සංකල්පනාත්මකව නෙළන ලද අල්ප උන්නත පුවරු කැටයමකි.
(2) පඩිපෙළක් පාමුල යෙදූ කැටයම් කරන ලද පුවරුවකි.
(3) පොළොන්නරු ශිල්පියාගේ ප්‍රතිභාවේ මහිමය පෙන්වන කැටයමකි.
(4) අනුරාධපුර කැටයම් ශිල්පියාගේ කුසලතාව නිරූපිත නිර්මාණයකි.
(5) බුදු දහමේ විස්තර වන 'භව චක්‍රය' නිරූපණය කිරීමට ගත් උත්සාහයකි. (.........)

**18.** **H** අක්ෂරයෙන් දැක්වෙන ඉන්දීය භාරුත් කැටයමෙන්,

(1) ජේතවන භූමිය බුදුරදුන්ට පිදීම නිරූපණය කෙරෙයි.
(2) බුදුරදුන් වෙනුවට බෝධිය යොදාගත් අවස්ථාවක් දැක්වෙයි.
(3) භාරුත් ශිල්පියා සතු සිද්ධි නිරූපණය කිරීමේ හැකියාව පැහැදිලි කෙරෙයි.
(4) අනේපිඬු සිටානන් බුදුරදුන් හමුවීම නිරූපණය කෙරෙයි.
(5) ජේතවනාරාමයේ බුදුරදුන් වැඩ සිටි අවස්ථාව නිරූපණය කෙරෙයි. (.........)

**19.** **I** අක්ෂරයෙන් දැක්වෙන ඉන්දු නිම්න මුද්‍රාවෙන් නිරූපණය වන්නේ,


(1) අං සහිත හිස්වැස්මක් පැළැඳි දෙවියෙකු වේ.
(2) වනයට හා සතුනට අධිපති දෙවියෙකු වේ.
(3) යෝගාසන ඉරියව්වෙන් සිටින යෝගාවචරයෙකු වේ.
(4) අං සහිත හිස්වැස්මක් පැළැඳි පශුපති වේ.
(5) ත්‍රිශූලයක් සහිත හිස්පළඳනාව පැළඳ සිටින ආගමික පූජකයෙකු වේ. (.........)

**20.** **J** අක්ෂරයෙන් දැක්වෙන කුලුනු කැටයම,


(1) ඉතා විසිතුරු ලෙස කැටයම් කරන ලද කොරින්තියන් කුලුනයි.
(2) කොරින්ත් නගරයේ බහුලව දක්නට ඇති කුලුනු වර්ගයයි.
(3) ඇතීනා දෙවොල තුළ දක්නට ඇති කුලුනු වර්ගයේ හිසයි.
(4) ග්‍රීසියේ පැරණිම කුලුනු වර්ගය වන ඩොරික් කුලුනයි.
(5) ග්‍රීසියේ බහුලව දක්නට ඇති අයොනික් කුලුනයි. (.........)

[පස්වැනි පිටුව බලන්න.

● ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන පිළිතුර** පහත සඳහන් **K, L, M, N, O** යනුවෙන් නම් කර ඇති කලා කෘති ඇසුරෙන් තෝරන්න.



K



L



M



N



O

**21.** **K** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) හින්දු ආභාසය මත ලෝකඩ වාත්තු ක්‍රමයට නිපද වූ ප්‍රතිමාවකි.
(2) මහාරාජ ලීලාවෙන් වැඩහිඳින රාජකීයයෙකුගේ පිළිරුවකි.
(3) අනුරාධපුර යුගයේ අවසාන භාගයට අයත් අවලෝකිතේශ්වර පිළිරුවකි.
(4) ලෝකඩ ඝන වාත්තු ක්‍රමයෙන් නිපදවා ඇති රන් ආලේපිත පිළිරුවකි.
(5) ලෝකඩ මාධ්‍යයෙන් වාත්තු කොට ඇති පද්මපානි බෝසත් රුවයි. (.........)

**22.** **L** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) දියුණු තාක්ෂණික ක්‍රමවේදයක් යොදාගෙන ඇති දැදිගමින් හමුවූ පහනකි.
(2) ක්‍රි.ව. 13-15 අතර කාලයට අයත් ලෝහමය ඇත් පහනකි.
(3) දැදිගමින් හමුවූ, එල්ලා තැබෙන අයුරින් නිර්මිත කලාත්මක ඇත් පහනයි.
(4) දියුණු තාක්ෂණයකින් හා කලාත්මක බවින් යුත් කොටවෙහෙර ඇත් පහනයි.
(5) ලෝහ වාත්තු ක්‍රමයට අනුව නිපදවා ඇති කලාත්මක ඇත් පහනකි. (.........)

**23.** **M** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) සැතපෙන ඉරියව්ව නිරූපිත පිහිටි ගලින් නෙළන ලද පිළිමයකි.
(2) පොලොන්නරුවේ ආලාහන පිරිවෙන් සංකීර්ණයට අයත් සැතපෙන පිළිමයයි.
(3) පල්ලව කලා ලක්ෂණ නිරූපණය වෙතැයි සැලකෙන පිළිමයකි.
(4) පැරකුම් රජ සමයේ නිර්මිත පොලොන්නරු ගල් විහාර සංකීර්ණයට අයත් සැතපෙන පිළිමයයි.
(5) විශිෂ්ට මූර්තිමය ලක්ෂණ නිරූපිත ගලින් කරන ලද පොලොන්නරු පිළිමයයි. (.........)

**24.** **N** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) දුෂ්කර ක්‍රියාව ආධ්‍යාත්මිකව හා භෞතිකව ගෙනහැර දැක්වෙන කෘතියකි.
(2) බෝසතුන්ගේ දුෂ්කර ක්‍රියාව යථාරූපීව නිරූපණය කිරීමට ගන්ධාර ශිල්පියා ගත් වෑයමකි.
(3) ගන්ධාර ශිල්පියාගේ මාධ්‍ය භාවිතයට හා ශිල්පීය හැකියාවට කදිම නිදසුනකි.
(4) බෞද්ධ සාහිත්‍යයේ විස්තර කෙරෙන දුෂ්කර ක්‍රියාව යථාරූපීව නිරූපණය වූවකි.
(5) බෝසතුන්ගේ කෘශ වූ සිරුරේ ස්වභාවය ශෛලමය මාධ්‍යයෙන් නිරූපිත පිළිමයකි. (.........)

**25.** **O** අක්ෂරයෙන් පිළිබිඹු වනුයේ,
(1) ග්‍රීක සම්භාව්‍ය යුගයේ නිම වූ ශ්‍රේෂ්ඨ නිර්මාණයකි.
(2) පුනර්ජීවන යුගයේ බිහිවූ ශ්‍රේෂ්ඨතම කිරිගරුඬ මූර්තියයි.
(3) ප්‍රතාපවත් පුද්ගලයෙකු නිරූපණයට ගත් ප්‍රශස්ත වෑයමකි.
(4) හෙලනිස්ටික් යුගයේ විසූ ශ්‍රේෂ්ඨ මූර්ති ශිල්පියෙකුගේ මූර්තියකි.
(5) ජූලියස් පාප් වහන්සේගේ සොහොන් ගැබෙහි ඇති ප්‍රධාන මූර්තියයි. (.........)

● ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන පිළිතුර** තෝරන්න.

**26.** යුරෝපයේ පශ්චාත් උපස්ථිතිවාදය ආරම්භ වීමට හේතු වූ ප්‍රධානතම කාරණය කුමක්ද?
(1) වස්තු විෂයට වඩා හැඟීම් ප්‍රකාශනය ප්‍රබල බව සැලකීමයි.
(2) ආලෝකය හා අඳුර ත්‍රිමාන ලක්ෂණ දැක්වීම සඳහා යොදා ගැනීමයි.
(3) යථාරූපී ප්‍රකාශන පිළිවෙත චිත්‍ර කලාවේ ඉදිරි ගමනට බාධාවක් ලෙස සැලකීමයි.
(4) උපස්ථිතිවාදයේ සීමා රීතීන් අභිබවමින් නව මං කෙරෙහි නැඹුරු වීමයි.
(5) ස්වභාවිකත්වය නිරූපණයට වඩා කල්පිතයන් කෙරෙහි ශිල්පීන්ගේ නැඹුරුව වැඩි වීමයි. (.........)

**27.** සාර්ථක කංචුක නිර්මාණයක දී වඩාත් වැදගත් වනුයේ,
(1) අන්තර්ගතයට ගැළපෙන අයුරින් වර්ණ, හැඩතල භාවිතය හා සැලසුම් කිරීමයි.
(2) මාතෘකාව සඳහා ගැළපෙන නිර්මාණාත්මක අක්ෂර භාවිත කිරීමයි.
(3) විවිධ තාක්ෂණික ක්‍රමවේද ගැළපෙන පරිදි ඇසුරු කොට ගැනීමයි.
(4) ගැළපෙන චිත්‍ර හා රූපසටහන් ආකර්ෂණීය ලෙස නිර්මාණය කිරීම ය.
(5) මුද්‍රණ තාක්ෂණයට අනුරූපව වර්ණ භාවිත කළ හැකි පරිදි නිම කිරීමයි. (.........)

**28.** චිත්‍රමය සංරචනයක් යනුවෙන් අර්ථ ගැන්වෙනුයේ,
(1) මනෝමය සංකල්පනාවක් විවරණය කෙරෙන වර්ණවත් ප්‍රකාශනයකි.
(2) කල්පිතයක් හෝ අත්දැකීමක් පදනම් කරගත් දෘශ්‍යමය ප්‍රකාශනයකි.
(3) වර්ණ, රේඛා, හැඩතල මාධ්‍යයෙන් කරනු ලබන තාත්වික ප්‍රකාශනයකි.
(4) අලංකාර හැඩතලවලින් හා පැහැපත් වර්ණ මාලාවකින් යුතු ප්‍රකාශනයකි.
(5) කිසියම් තේමාවක් වින්දනාත්මකව හා නිර්මාණශීලීව ප්‍රකාශ කිරීමකි. (.........)

**29.** මුද්‍රණය සඳහා ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කිරීමේ දී වඩාත් වැදගත් වනුයේ,
(1) සරල හැඩතල හා සීමිත වර්ණ මාලාවක් යොදා ගැනීමයි.
(2) නිර්මිත මෝස්තර කොටස සෙසු කොටස් සමග සෑම පැත්තකින්ම සම්බන්ධ කිරීමයි.
(3) නිර්මාණශීලී හැඩතල භාවිතය හා සිත්ගන්නාසුලු වර්ණ යෙදීමයි.
(4) කොටු රටාවක් මත පිහිටා සමාන ඒකක ගණනාවකින් තලය පිරියන සේ ඇඳීමයි.
(5) යොදාගත් හැඩතල තුළ ශීත හා උෂ්ණ වර්ණ සංගතව යෙදීමයි. (.........)

**30.** නිශ්චල ද්‍රව්‍ය අධ්‍යයනයේ දී අපේක්ෂා කෙරනුයේ,
(1) මූලික සිද්ධාන්ත අනුව ද්‍රව්‍ය සමූහය අභිමත පරිදි ඇඳ, වර්ණ කර, නිම කිරීමයි.
(2) මූලික සිද්ධාන්ත භාවිත කරමින්, ගති ලක්ෂණ මතුවන පරිදි ඇඳ, වර්ණ කිරීමයි.
(3) ද්‍රව්‍ය සමූහයට අයත් වස්තූන් ත්‍රිමාණ ලක්ෂණ මතුවන අයුරින් ඇඳ, වර්ණ කිරීමයි.
(4) ද්‍රව්‍ය සමූහයේ අන්තර්ගත වස්තූන් නිවැරදිව ඇඳ, වර්ණ කිරීමයි.
(5) එක් එක් වස්තූන් වෙන වෙනම ඇඳ, ඒවායේ ස්වභාවය අනුව වර්ණ කිරීමයි. (.........)


● ප්‍රශ්න අංක **31** සිට **35** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** ඊට ඉදිරියෙන් දී ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් තෝරන්න.

**31.** මෙහි දැක්වෙන ගොඩනැගිල්ල,



(1) සුවිසල් ගල් තලාවක් මත ඉදිකර ඇති විහාරස්ථානයකි.
(2) බුවනෙකබාහු රජ දවස ගණේශ්වරාචාර්ය විසින් ඉදිකරන ලද්දකි.
(3) දකුණු ඉන්දීය වාස්තු විද්‍යා ලක්ෂණ අනුව ඉදිකරන ලද්දකි.
(4) බෞද්ධ හා හින්දු ආගමික මධ්‍යස්ථානයක් ලෙස ඉදිකරන ලද්දකි.
(5) ගම්පොළ යුගයේ දී ස්ථපතිරායර් ශිල්පියා විසින් ඉදිකරන ලද්දකි.
(.........)

**32.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය,



(1) අනුරාධපුර රාජකීයයන් වෙනුවෙන් කළ ශෛලමය ජල තටාකයකි.
(2) අනුරාධපුර ශෛලමය පොකුණු අතර සුවිශේෂී නිර්මාණයකි.
(3) වාරි තාක්ෂණ නිපුණත්වය පෙන්වන අගනා ශෛලමය කලා නිර්මාණයකි.
(4) අභයගිරි විහාර භූමිය තුළ ඉදිකරන ලද ශෛලමය පොකුණු යුගලයකි.
(5) මනාව ඔපමට්ටම් කරන ලද ශෛලමය පුවරුවලින් කරන ලද්දකි.
(.........)


**33.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය,



(1) රාජ රාජ චෝල තම මෙහෙසිය වෙනුවෙන් කළ, අංක 2 ශිව දෙවොලයි.
(2) කපා සැකසූ ගල් පුවරු යොදා කළ ශිව දෙවොලයි.
(3) පොලොන්නරුවේ හින්දු ආගමික ඊශ්වරම් දෙවොලකි.
(4) දකුණු ඉන්දීයානුවන් විසින් තම පුද පූජා සඳහා කළ දෙවොලකි.
(5) දකුණු ඉන්දීය චෝල වාස්තු විද්‍යා ලක්ෂණ නිරූපිත අංක 1 ශිව දෙවොලයි.

(.........)


**34.** මෙහි දැක්වෙන අජන්තා ගුහාව,



(1) චිත්‍ර ඇඳි ගුහා අතුරින් එකකි.
(2) චෛත්‍ය ශාලාවක අභ්‍යන්තර දසුනකි.
(3) විසිතුරු ලෙස සැකසූ විහාර ශාලාවකි.
(4) භික්ෂූන් වහන්සේලාගේ රැස්වීම් ශාලාවකි.
(5) අලංකාර කුලුනු සහිත වෘත්තාකාර ශාලාවකි.

(.........)

**35.** මෙහි දැක්වෙන දෙවොල,



(1) පාරාවෝ රජවරුන් උදෙසා ඉදිකරන ලද්දකි.
(2) ඊජිප්තුවේ ඉදිකළ දේවස්ථාන අතුරෙන් එකකි.
(3) හොරස් දෙවියන් උදෙසා කැපවූ එඩ්ෆු දෙවොලයි.
(4) ඇමෝන් හිරු දෙවියන් උදෙසා ඉදිකළ කාර්නැක් දෙවොලයි.
(5) නයිල් ගංගාධරයේ නැගෙනහිර ඉවුරේ පිහිටි ලක්සෝර් දෙවොලයි.

(.........)

● ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන පිළිතුර** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36.** මෙම සිතුවම,

(1) තීබස් හි සොහොන් ගැබකින් හමුවූවකි.
(2) ගීසා හි දෙවොලකින් සොයා ගැනුණකි.
(3) මධ්‍ය රාජධානි යුගයේ දී සිතුවම් වූවකි.
(4) අමර්නා හි සොහොන් ගැබකින් හමුවූවකි.
(5) පැරණි රාජධානි යුගයට අයත් එකකි.

(.........)

**37.** මෙම සිතුවමෙහි තේමාව වී ඇත්තේ,

(1) වංශාධිපතියෙකුගේ තේජස හා බලපරාක්‍රමය ප්‍රකාශ කිරීමයි.
(2) පැපිරස් ගස් අතර දඩයමේ යෙදෙන රජෙකුගේ ක්‍රියාකාරකමකි.
(3) වංශාධිපතියෙකු සිය පවුලේ අය සමග ඔරුවක නැගී කුරුලු දඩයමේ යෙදීමයි.
(4) වංශාධිපති යුවලක් පරිසරයේ සුන්දරත්වය විඳින අවස්ථාවකි.
(5) වංශාධිපතීන් පිරිසක් පැපිරස් ගස් අතරින් ඔරු සවාරියක යෙදෙන අවස්ථාවකි. (.........)

**38.** මෙම සිතුවම සංරචනය කිරීමේ දී,

(1) පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ හා පරිමාණ රීති නොසලකා හැර ඇත.
(2) මානව රූප සහ සත්ත්ව රූප තලය පුරා විසිරී යන සේ නිරූපණය කර ඇත.
(3) තේමාවට උචිත අයුරින්, හැඩතල අතර සබඳතාව රැකෙන පරිදි, රූප ගළපා ඇත.
(4) ප්‍රධාන චරිතය සේම සෙසු චරිත ද විශාලත්වයෙන් යුතුව දක්වා ඇත.
(5) ස්වභාවික හා සාම්ප්‍රදායික හැඩතල තලය පුරා සමබරව ගළපා ඇත. (.........)

**39.** මෙම සිතුවම ඇඳීමේ දී හා වර්ණ ගැන්වීමේ දී,

(1) සාම්ප්‍රදායික රේඛාකරණයක් සහ වර්ණ රටාවක් අනුගමනය කර ඇත.
(2) සත්ත්ව රූප ස්වභාවිකව හා මානව රූප සාම්ප්‍රදායිකව සිතුවම් කර ඇත.
(3) ශීත වර්ණයට මුල් තැන දෙමින් රූප සවිස්තරාත්මකව ඇඳ ඇත.
(4) වර්ණ සහ රේඛා සමබර ආකාරයෙන් උපයෝගී කොට ගෙන ඇත.
(5) ශීත වර්ණ හා උෂ්ණ වර්ණ මනාව ගලපමින්, වර්ණ හා හැඩතල යොදා ඇත. (.........)

**40.** මෙම සිතුවම ගැන විමසීමේ දී,

(1) ශිල්පියා නිදහස් ප්‍රකාශනය හා පැවති සම්ප්‍රදාය අතර අතරමං වී ඇති අයුරු පෙනේ.
(2) ඊජිප්තු වංශාධිපතීන් හා සොබාදහම අතර පවත්නා අරගලය අනාවරණය වේ.
(3) ගහ කොළ, සතා සිව්පාවාට වඩා වංශාධිපතීන් බලවත් ය යන්න පැහැදිලි වේ.
(4) සුන්දර සොබාදහමේ අසිරිය වින්දනය කරන්නන් පිළිබඳව විවරණ කෙරෙයි.
(5) මිනිසාගේ කෙළිලොල් බවට සුන්දර සොබාදහම ගොදුරු වී ඇති අයුරු පෙනෙයි. (.........)

* *